# ගොවි සමාගම් සහ කාර්යභාරය

## (පසුබිම, ව්‍යුහය සහ ක්‍රියාකාරිත්වය පිළිබඳ විමසුමක් ...)

ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින විසි ලක්‍ෂයක් පමණ වන ගොවි පවුල් වල අභිවෘද්ධිය සහ ආර්ථික ස්ථායීකරණය සඳහා දැනට ක්‍රියාත්මක කරනු ලබන ගොවි සමාගම්, කොතෙක් දුරට ග්‍රාමීය කෘෂි අංශයේ පැතිර පවත්නා ගොවි ගැටළු විසඳීම සඳහා ඉවහල් වේද? යන්න විමසා බැලීම, මෙම ලිපියේ පරමාර්ථය වේ. මේ සඳහා, දැනට ලංකාවේ ක්‍රියාත්මක වෙමින් පවතින ගොවි සමාගමවල ක්‍රියාකාරිත්වය සැලකිල්ලට ගනිමින් එහි පසුබිම, ගොවි සමාගම අවශ්‍ය ඇයි? ගොවි සමාගම පිහිටුවීමෙ ක්‍රියාවලියේ විවිධ අවස්ථා, එහි ව්‍යුහය, කාර්යභාරය සහ අභියෝග යන කරුණු මෙමගින් ඉදිරිපත් කෙරේ.

**ගොවි සමාගම් හි ආරම්භය මෑතක දී ඇති වුවත්, ගොවි ගැටළු විසඳ ගැනීම සඳහා ගොවීන් එකමුතු වී ගොවි සංවිධාන බිහි කිරීම ආරම්භ වූයේ 1970 දශකයේ අග භාගයේ සිට ය. 1978 වර්ෂයේ ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ, සුළු ගොවි සංවර්ධන වැඩසටහන, ග්‍රාම සංවර්ධන පුහුණු ආයතනය මගින් ක්‍රියාත්මක කරනු ලැබූ විපර්යකාරක වැඩසටහන (1978) සහ ඉන්පසු කෘෂිකර්ම, ගොවිජන සේවා, වාරිමාර්ග දෙපාර්තමේන්තු යටතේ වාරි කළමනාකරණය මූල් කරගෙන ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් යටතේ ගොවි සංවිධාන පිහිටුවීම, ගොවීන් සංවිධානය කිරීමේ ප්‍රධාන ආයතනික ක්‍රියාවලිය වශයෙන් සලකනු ලැබිය හැකිය.** මෙසේ ගොවි සංවිධාන පිහිටුවීමෙන් අපේක්‍ෂා කරනු ලැබුවේ සුළු ගොවියා ශක්තිමත් කොට, ඔවුන් කෘෂි හා වාරිමාර්ග සංවර්ධන වැඩසටහන් හි කොටස් කරුවන් බවට පත් කිරීම යි. මෙලෙස සුළු හා මහා වාරි මාර්ග පද්ධති වල, ජල කළමනාකරණය, කෘෂි ණය පහසුකම් ලබා ගැනීම, ව්‍යාප්ති සේවා සහ අලෙවි ගැටළු විසඳ ගැනීම සඳහා ආයතනික ව්‍යුහයක් වශයෙන් ගොවි සංවිධාන ක්‍රියාවට නංවනු ලැබුණි. ගොවි සංවිධාන තුළින් ගොවි ගැටළු විසඳ ගැනීම ඉතා සාර්ථකව සිදු වූ අතර එමගින්, ගොවීන් හා නිලධාරීන් අතර සබඳතා වර්ධනය වී, වැඩි අස්වැන්නක් හා ඵලදාවක් ලබා ගැනීමට අවශ්‍ය පසුබිම සැකසුනි.

1970 දශකයේ අග භාගයේ සිට මේ දක්වා, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වෙමින් පවතින නිදහස් ආර්ථික ප්‍රතිපත්ති සමඟ සහභාගිත්ව සංවර්ධන උපක්‍රමයක් වශයෙන් ගොවි සංවිධාන මගින් ඉටුකර ගත හැකි කාර්යභාරය සීමා වී තිබේ. මෙයට හේතුව වී ඇත්තේ, තරඟකාරී ආර්ථික රටාවක් තුළ ගොවි සංවිධානයක ක්‍රියාවලිය, හුදෙක් ස්වේච්ඡා සංවිධානයක ක්‍රියාවලියකට සීමා නොකොට වඩාත් පුළුල් හා ලාභදායී ගොවි ව්‍යාපාර සඳහා ගොවියා යොමු කළ යුතු වීමයි. දැනට **ලංකාවේ ගොවීන්ගෙන් සියයට 70 ක් පමණ සුළු ගොවීන් වන අතර ඔවුන්ගේ ජීවන මට්ටම හොඳින් පවත්වාගෙන යාමට නම් එය යැපුම් කෘෂිකාර්මික දිවි පෙවෙතකට වඩා ආර්ථික වශයෙන් ඵලදායී කෘෂි ජීවන රටාවක් බවට පත්කළ යුතු වේ.** මේ සඳහා ගොවියා නිෂ්පාදකයෙකු වශයෙන් මුහුණ දෙන ණය, වෙළඳපොළ සහ කෘෂිකාර්මික සේවා වැනි ගැටළු විසඳීම සහ නිෂ්පාදන අවදානම අඩු කිරීම සඳහා ක්‍රියාමාර්ග සකස් විය යුතුව තිබේ. මෙම ගැටළු වලට මුහුණ දීම ගොවියාට තනිවම කළ නොහැකි දෙයකි. එබැවින්, මේ සඳහා තිරසාර සහ ක්‍රියාත්මක වැඩ සටහනක් වශයෙන් ගොවි සමාගම ඇති කිරීමට 1997 දී හඳුන්වා දුන් නව කෘෂි ප්‍රතිපත්තිය යටතේ නිර්දේශ කොට තිබේ.

**ශ්‍රී ලංකාවේ ගොවීන්ගෙන් 70% ක් පමණ සුළු ගොවීන් වන අතර ඔවුන්ගේ ජීවන මට්ටම හොඳින් පවත්වා ගෙන යාමට නම් එය යැපුම් කෘෂිකාර්මික දිවි පෙවෙතකට වඩා ආර්ථික වශයෙන් ඵලදායී කෘෂි ජීවන රටාවක් බවට පත් කළ යුතු වේ.**

## ගොවි සමාගම් අවශ්‍ය ඇයි?

ඉහතින් සාකච්ඡා කළ පරිදි මෙතෙක් ක්‍රියාත්මක වූ හා වෙමින් පවතින විවිධාකාර වූ ගොවි සංවිධාන මගින් වර්තමාන ගොවියා මුහුණ දෙන සියළුම කෘෂිකාර්මික ගැටළු වලට විසඳුම් සෙවීම අපහසු වී තිබේ

**ඉඩම් බෙදීයාම අනුව ශ්‍රී ලංකාවේ සුළු ගොවීන් වශයෙන් වෙළඳපොල සමඟ කේවල් කිරීමේ අපහසුතා පවතී.**

විශේෂයෙන්ම, නිදහස් ආර්ථික රටාවක් යටතේ යැපුම් මට්ටමේ සිටින ග්‍රාමීය සුළු ගොවියාට වෙළඳපොල බලවේග සමග තරඟ කිරීම අපහසු ය. එසේම, වඩාත් ලාභදායි ආර්ථික බෝග තෝරා ගැනීමේදී ඇති වන අවදානම දැරීමට අපහසු වේ. මේ නිසා, දැනට ලංකාවේ පවතින කෘෂි ගැටළු හා ආර්ථික පරිසරය අනුව, ගොවි සමාගම් ඇති කිරීම ඉතා අවශ්‍ය වූවකි.

දැනට ක්‍රියාත්මක වන **ලෝක වෙළඳ සංවිධානය (WTO) හා දකුණු ආසියානු වරණාත්මක වෙළඳ ගිවිසුම (SAPTA)** යන ගිවිසුම් අනුව, තීරු බදු නොමැති නිදහස් වෙළඳ ක්‍රමයක් යටතේ, **ශ්‍රී ලංකාවේ කුඩා ගොවීනට තරඟ කිරීමට සිදුවන්නේ ලංකාව තුළ සිටින ගොවීන් සමඟ පමණක් නොව, ආසියානු කලාපීය සහ සෙසු ජාත්‍යන්තර ගොවීන් සමඟ ය.** මේ නිසා, වඩාත් ලාභදායි සහ සාපේක්ෂව වාසිදායී බෝග නිෂ්පාදනයට ගොවියා පෙළඹ විය යුතු අතර එහිදී, **බෝග විවිධාංගීකරණය** යටතේ සිදුවිය හැකි අවදානම්කාරී තත්ත්වයන්ට මුහුණ දීමට ගොවි සමාගම් පිහිටුවීම අවශ්‍ය වේ.

ගොවි සමාගම් විධිමත්ව පවත්වාගෙන යැමෙන් කෘෂි බෝග විවිධාංගීකරණය කිරීම පහසු විය හැකි අතර දිවයින පුරා පවතින සමාගම් වලට, එම ප්‍රදේශවල පවතින සුවිශේෂ වාසිදායක තත්ත්වයන් සැලකිල්ලට ගෙන තරඟකාරි මට්ටමකින් නිෂ්පාදන කටයුතු කිරීමේ හැකියාව ලැබේ.

**ඉඩම් බෙදීයාම අනුව, ශ්‍රී ලංකාවෙ සියයට හැත්තෑවකට වැඩි පිරිසකට ඇත්තේ හෙක්ටයාර් 1 කට අඩු ඉඩම් ප්‍රමාණයක් නිසා, සුළු ගොවීන් වශයෙන් වෙළඳපොල සමඟ ඔවුන්ගේ කේවල් කිරීමේ හැකියාව ඉතාමත් අඩුය.** මේ සඳහා ගොවි සමාගම් වල කොටස්කරුවන් වශයෙන් වෙළඳපොල බලවේග සමඟ කේවල් කිරීමට සුළු ගොවියාට හැකියාවක් ලැබේ. එසේම ණය අවශ්‍යතා හා බැංකු සමග කේවල් කර ණය සහ සේවා පහසුකම් ලබා ගැනීමට ද හැකියාවක් පවතී.

වෙළඳපොල බලවේග වලට ඔරොත්තු දෙන ආකාරයට සහ ඉල්ලුමට සරිලන අයුරින් කෘෂි නිපැයුම් විවිධාංගීකරණය කිරීමට හා භාණ්ඩ සැකසීමට ගොවි සමාගම් වලට හැකිවන අතර එමගින් කෘෂි කටයුතු ආශ්‍රිත කර්මාන්ත හා සේවාවන් ඇති කිරීම සඳහා ද හැකියාව ලැබේ. නිදසුන් වශයෙන්, සහල් මළු කර වෙළඳපොලට එවීම සහ සහල් පිටි නිෂ්පාදන ඇති කිරීම වැනි කර්මාන්ත මගින් කෘෂි බෝග සඳහා හොඳ මිලක් ලබාගත හැකිය. මෙලෙස කෘෂි සම්පත් ප්‍රශස්ථ ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා ගොවි සමාගම් වලට ක්‍රියාකළ හැකි අතර එමගින් ගොවියාගේ ආදායම් මට්ටම ඉහළ දැමීමට ද හැකිවනු ඇත.

## ගොවි සමාගම් ක්‍රියාවලියේ විවිධ අවස්ථා

ගොවි සංවිධාන ක්‍රියාකාරීත්වය පිළිබඳ මනා අත්දැකීම් ඇති අය ගොවි සමාගමක් පිහිටුවීමද ඉතා සරල හා පහසු කාර්යයක් යැයි සිතුවහොත් එය වැරදිය. **සාර්ථක ගොවි සමාගමක් ඇති කිරීමට නම් එය සංවිධානයක් වශයෙන් අදියර 5 ක් සම්පූර්ණ කළ යුතු වේ.** ප්‍රථම අදියර වන්නේ අවදානම භාර ගැනීම හෝ අවදානමට මුහුණ දීමේ අවස්ථාවයි. (Venture Seeking Stage) මෙහිදී දියුණු කල යුතු ආර්ථික කටයුතු, කොටස් වෙළඳපොල, සමාගම් කොටස් මුදල් සහ දියුණු කල හැකි මූලික ප්‍රාග්ධන සම්පත් ආදිය ගැන කරුණු විමසා බැලිය යුතු වේ.

දෙවන අදියර වන්නේ, විධිමත් සංවිධානයක් බවට පත් කිරීමේ අවස්ථාවයි (Organization Formalizing Stage). මෙහිදී, සමාගම ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත භූගෝලීය බල ප්‍රදේශය, කොටස් කරුවන්ගේ ස්වරූපය, ලියාපදිංචිය, ව්‍යවස්ථා කටයුතු සහ මෙහෙයුම් පරිමාණය වැනි කරුණු සැලකිල්ලට ගැනීමයි.

**සාර්ථක ගොවි සමාගමක් ඇති කිරීමට නම් එය සංවිධානයක් වශයෙන් අදියර 05 ක් සම්පූර්ණ කළ යුතු වේ.**

තෙවන අදියර වන්නේ, වෙළඳපොල සබඳතා ඇති කිරීමේ

අවස්ථාවයි (Market Links Building Stage).මේ අවස්ථාවේදී, ඉදිරියට ඇති කිරීමට යෝජිත වෙළඳපොල ගිවිසුම්, ව්‍යාපාරික කටයුතු, අලෙවි ප්‍රදේශ, වෙළඳ ආයතන, ණය සහ සහන සේවා ආයතන, සමඟ සබඳතාව ඇති කර ගැනීමයි.

සිව්වන අදියර වන්නේ,

**ගොවි සමාගම් කටයුතු කෙරෙහි, ප්‍රධාන වශයෙන් බලපාන කරුණු අතර නිළධාරීන් ඇතුළු රාජ්‍ය අංශයේ උනන්දුව, ගොවීන්ගේ උනන්දුව සහ ව්‍යාපාරික ප්‍රජාවගේ උනන්දුව වැදගත් වේ.**

ව්‍යාපාර මෙහෙයුම් අවස්ථාවයි. (Business Operation Stage). මෙහිදී, සමාගම් කාර්ය මණ්ඩලය, කාර්යාලය, ගොඩනැගිලි හා සේවා පහසුකම් සහ වෙළඳපොල සබඳතා ගැන සැලකිය යුතුය.

මෙම කරුණු සැලකිල්ලට ගෙන පිහිටුවනු ලබන **ගොවි සමාගම් කටයුතු කෙරෙහි, ප්‍රධාන වශයෙන් බලපාන කරුණු 03 කි. එනම්, නිළධාරීන්ගේ හා රාජ්‍ය අංශයේ උනන්දුව, ගොවීන්ගේ උනන්දුව සහ ව්‍යාපාරික ප්‍රජාවගේ උනන්දුවයි.** මෙම පාර්ශවයන්ගේ අන්තර් සබඳතාවය සමාගම් වල කටයුතු කෙරෙහි සෘජු ලෙසම බලපාන අතර මෙම පාර්ශව තුනෙහිම උනන්දුව සහ කැපවීම සමාගමේ සාර්ථකත්වයට බලපාන බව සඳහන් කළ යුතු වේ.

නිළධාරීන්ගේ සහ රාජ්‍ය අංශයේ උනන්දුව සහ කැපවීම මත **"ලෝක වෙළඳ සංවිධානය"** සහ **"සප්තා"** වෙළඳ ගිවිසුම් ක්‍රියා කිරීම, නිළධාරි වාදය නැති කිරීම, කෘෂි සහ වෙළඳ ප්‍රතිපත්ති වල ගැටළු නැති කිරීම වැනි කටයුතු කල හැකි වේ. ගොවීන්ගේ මන්දෝත්සාහි බව, අවදනම් දැරීමට ඇති අකමැත්ත, ප්‍රමාණවත් දැනුමක් හා පුහුණුවක් නැතිකම, තොරතුරු නොලැබීම වැනි ගැටළු ගොවීන්ගේ උනන්දුව තුලින් නැතිකර ගත හැකිය. වෙළඳපොල අවදනම, අඩු ලාභදායිතාවය, අරපිරිමැස්ම සහ වෙළඳපොල පාලනය වැනි කරුණු ව්‍යාපාරික ප්‍රජාවගේ උනන්දුව සහ කැප කිරීම මත අවම කරගත හැකිය.

### ව්‍යුහය

**ගොවි සමාගමක ආයතනික ව්‍යුහය** ප්‍රධාන පාර්ශවකරුවන් තිදෙනෙකුගෙන් සමන්විතය. එනම්, එහි ප්‍රධාන කොටස් කරුවන්, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමණාකාරිත්වය යන පිරිස් වලිනි. මේ අනුව කොටස් කරුවන් සම්බන්ධ වන්නේ ඔවුන් යෙදවූ කොටස් මුදල් මත හෝ භෞතික හෝ භූගෝල විද්‍යාත්මක පිහිටීම මතය (උදා : වාරිමාර්ග යෝජනා ක්‍රමයක හෝ

**ලංකාව පුරා විසිරී සිටින කුඩා ගොවීන්ගේ එක් මූලික ගැටළුවක් වී ඇත්තේ ඔවුන්ගේ නිෂ්පාදන වලට සාධාරණ මිලක් නොලැබී යාමයි.**

වෙනත් භූගෝලීය ව්‍යාප්තියක් ඇති ව්‍යාපෘති) විශේෂයෙන් නියෝජනය කල යුතු කණ්ඩායම් සිටින විට ඒ අනුව කොටස් අනුපාත තීරණය කල හැකිය. සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලය කොටස් කරුවන් නියෝජනය වන පරිදි පත්කර ගැනීමේ හැකියාව පවතී. අධ්‍යක්ෂ මණ්ඩලයට සමාගම සම්බන්ධව සියළු විධායක බලතල හිමිවන අතර එයට සභාපතිවරයෙක් ද, පත් කරගත යුතුය. සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය දෙනු ලබන නියෝග ක්‍රියාත්මක කරවීම සඳහා සමාගමේ සේවයට කාර්යය මණ්ඩලයක් පත් කරගත හැක. එම කාර්ය මණ්ඩලය බොහෝ විට, සකස් විය යුත්තේ තාක්ෂණ හා විෂයානුබද්ධ දැනුමක් ඇති නිළධාරිගෙන් වන අතර ඔවුන් විසින් සම්පත් කළමනාකරණය සහ සමාගම් මෙහෙයුම් කටයුතු සිදු කල යුතු වේ.

### කාර්යභාරය

ගොවි සමාගමක ප්‍රධාන කාර්යභාරය විය යුත්තේ විසිරී සිටින කුඩා ගොවීන් වෙළඳපොල සමඟ සම්බන්ධ කිරීමයි. **ලංකාව පුරා විසිරී සිටින බොහෝ කුඩා ගොවීන්ගේ එක් මූලික ගැටළුවක් වී ඇත්තේ ඔවුන්ගේ නිෂ්පාදන වලට නියමිත සාධාරණ මිලක් නොලැබී යාමයි.** බොහෝ විට, ප්‍රධාන මාර්ගයෙන් දුරස්ථව වාසය කරන මෙම ගොවීන්ගේ නිෂ්පාදන වෙළඳපොලට ගෙන ඒමට ප්‍රවාහන පහසුකම් නොමැති අතර ඒ හේතුවෙන් ඔවුන් නිරන්තරයෙන්ම පුද්ගලික වෙළඳුන්ගේ ඒකාධිකාරයට යටත් වී සිටී. **සම්ප්‍රදායික ණය චක්‍රයට හෝ ණය උගුලට අසුවී සිටින මෙම සුළු ගොවීන්ගේ ආර්ථික තත්ත්වය ඉතා පහත් මට්ටමක පවතී. මේ නිසා, ගොවි සමාගමක මූලික කාර්යය වශයෙන් ගොවීන්ගේ නිෂ්පාදන වලට වෙළඳපොලක් සැපයීම ද කල යුතු වූවකි.**

ගොවි නිෂ්පාදන වලට වෙළඳපොලක් සැපයීම පහසු කාර්යයක් නොවේ. ප්‍රථමයෙන් මේ සඳහා කළ යුතු වන්නේ, අදාළ ගොවි සමාගම ඇති ප්‍රදේශයේ වගා කරන බෝග සහ නිෂ්පාදන පිළිබඳ නිවැරදි තත්ත්වය දැන ගැනීමයි. ඒ අනුව, **තම ප්‍රදේශයෙන් මාසිකව හෝ වාර්ෂිකව සැපයිය හැකි කෘෂි බෝග හා නිෂ්පාදන වල ප්‍රමාණයන් සමාගම දන්නේ නම්, ඒ අනුව එම නිෂ්පාදන විකිණිය හැකි වෙළඳපොලක් හෝ ගැනුම්කරුවන් සොයා ගැනීමට පහසු වේ.** ප්‍රදේශයෙන් පිටත විශේෂයෙන් අගනුවරට කේන්ද්‍ර ගතවී සිටින ගැනුම් කරුවන් හමුවී ඔවුන්ගේ අවශ්‍යතා සහ ඔවුන්ට අවශ්‍ය ප්‍රමාණයන් දැනගෙන ඒ අනුව, ඔවුන් සමග ගිවිසුමකට එළඹිය යුතුය. ඊට පසු, ගොවි නිෂ්පාදන අදාළ ගැනුම්කරුවන්ට සැපයීම කල හැකි අතර බොහෝ විට, ගැනුම් කරුවන් සෘජුවම ගොවීන්ට සම්බන්ධ කරවීමට ද හැකියාව ලැබේ. මෙහි දී, නිෂ්පාදන සැපයීමේ කොන්ත්‍රාත්තුව ගොවි සමාගම ලබා ගන්නා සේම ඒ පිළිබඳ අවදානම දැරීමට ද සමාගම බැඳී සිටී. මෙය තරහකාරී වෙළඳපොල ක්‍රමයක් යටතේ සුළු ගොවීන්ට තනිවම කල නොහැකි දෙයකි. එමනිසා, ගොවි සමාගමේ කොටස් කරුවන් වශයෙන් ගොවියා ද එම ක්‍රියාවලියට සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වේ.

මෙම සියළුම කටයුතු වලින් අවසාන වශයෙන් අපේක්ෂා කරන්නේ සුළු ගොවියාගේ ජීවන මට්ටම ඉහල දැමීමයි. එමඟින් ගොවිතැන සම්බන්ධයෙන් දැනට පවතින අවදානම අඩුකොට ආහාර සුරක්ෂිතභාවය සහතික කිරීමට හැකියාව ලැබෙනු ඇත.


**ජී.එම්. හේනෙගෙදර**

අංශ ප්‍රධාන

***කෘෂි කාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය***

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.


## 30 වෙනි සංවත්සරය

# හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය



*හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 30 වෙනි සංවත්සරය වෙනුවෙන් පැවැති ඡායාරූප හා පොත් ප්‍රදර්ශනය විවෘත කළ කෘෂිකර්ම, පශු සම්පත් හා සමෘද්ධි අමාත්‍ය ගරු එස්.බී. දිසානායක මැතිතුමා වෙත ආයතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය එම්.ඕ.ඒ. ද සොයිසා මහතා විසින් ප්‍රකාශන කට්ටලයක් පිළි ගැන්විණි. මෙම අවස්ථාවට ආයතනයේ කාර්ය මණ්ඩලය, රාජ්‍ය නිළධාරීන් මෙන්ම මාධ්‍යවේදීහු විශාල පිරිසක් සහභාගි වූහ.*